## නීතිරීති සහ කොන්දේසි

පසුපිටෙහි ටෙලෙක්සි මුදල් යැවීම් සිදුකිරීමට බැංකුවෙන් ඉල්ලා සිටීම මත, එය පහත දැක්වෙන කොන්දේසි වලට අනුකූලව ක්‍රියාවේ යෙදවිය යුතු වන බවට මම/අපි මෙමගින් එකග වී සිටිමි(මු).

1. සම්පූර්ණයෙන්ම මාගේ/අපගේ අවදානම යටතේ ටෙලෙක්ස් මාරුකිරීම් යැවීමට බැංකුවට නිදහස පවතියි. පණිවුඩය සම්ප්‍රේෂණය කිරීමේදී හෝ එය ලැබුණු පසුව වැරදි ලෙස අර්ථකථනය කිරීමෙන් හෝ ගෙවීම සිදුකළ යුතු වන රටේ නිෂ්කාශන පද්ධතියෙන් සිදුවිය හැකි යම් ප්‍රමාදයක් නිසා හෝ යැවූ මුදල ලබාගැනීමේදී අර්ථලාභියාගේ බැංකුවේ යම් ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ නොසැළකිල්ලක් නිසා සිදුවිය හැකි කිසිදු හානියක්, ප්‍රමාදයක්, වරදක්, නොකරහැරීමක් සඳහා බැංකුව වග නොකියනු ඇත. කිසිදු අවස්ථාවකදී කිසිදු තත්ත්වයක් යටතේ බැංකුව කිසිදු ලාභ නොලැබී යාමක් හෝ ගිවිසුම් නොලැබීමක් හෝ විශේෂ, වක්‍ර හෝ ද්විතීයික හානි හෝ පාඩු සඳහා වගකීමට බැඳී නැත. අර්ථලාභියාගේ අවංකභාවය හෝ අව්‍යාජභාවය තහවුරු කරගැනීමට බැංකුව බැඳී නොමැති අතර, එහි සම්පූර්ණ වගකීම ගනුදෙනුකරු/මුදල් යවන්නා අත පවතියි.

2. විශේෂිත උපදෙස් නොමැති විට ටෙලෙක්ස් මුදල් මාරුකිරීම් ගෙවීම සිදුකළ යුතු වන රටේ මුදල් වර්ගයෙන් සිදුකෙරෙනු ඇත.

3. ශ්‍රී ලංකාවෙන් පිටත සියළු අයකිරීම්/කොමිස් මුදල් විශේෂිතව දක්වා නොමැති නම්, ඒවා අර්ථලාභියාගේ ගිණුමෙන් අයකෙරේ.

4. මෙහෙයුම් තත්ත්වයන් මත අවශ්‍ය වුවහොත්, මුදල් යවන්නා විසින් දක්වා ඇති රටට වෙනස් රටක සිට ටෙලෙක්ස් මාරුකිරීම යැවීමට බැංකුව අයිතිය රඳවාගනියි.

5. මාරුකිරීම මුදල් බවට හැරවීම එම මුදල් බවට හරවන රටේ නීතිරීති හා රෙගුලාසි මගින් පනවා ඇති යම් විනිමය පාලන හෝ වෙනත් සීමාකිරීම් වලට යටත් වනු ඇත. එවැනි නීතිරීති සහ රෙගුලාසි මගින් සිදුවන යම් පාඩුවක් හෝ ප්‍රමාදයක් සඳහා බැංකුව හෝ එහි අනුයෝජිතයන් හෝ නියෝජිතයන් වග නොකියනු ඇත.

6. එම දිනයේ ම වටිනාකම සඳහා වන අයදුම්පත්, ගමනාන්ත භූගෝලීය ස්ථානයට අදාල වන වෙන්කිරීමේ කාලසීමාවන්ට යටත් වනු ඇත.

7. අයදුම්කරු විසින් යැවූ මුදල් බැංකු වෙතින් ආපසු ලබාගැනීමට අදහස් කරන්නේ නම්, බැංකුව විසින් එහි අභිමතය පරිදි සියළු ගාස්තු හා වියදම් අඩුකිරීමෙන් පසු අදාල මුදල් වර්ගයේ පවතින මිලදීගැනීම් අනුපාතයට අයදුම්කරු වෙත ගෙවීම සිදුකරනු ඇත.

8. පූර්ව දැනුම් දීමකින් තොරව මුදල් යැවීමේ සියලුම ගාස්තු කලින් කලට සංශෝධනය කිරීමට බැංකුව අයිතිය රඳවාගනියි.

9. මුදල් විශුද්ධිකරණ විරෝධී/නීතිවිරෝධී ගණුදෙනු - කිසියම් තැනැත්තෙකු විසින් යම් රටක නීතියක් හෝ රෙගුලාසියක් කඩකිරීමකට සම්බන්ධ යැයි බැංකුව විශ්වාස කරන ගෙවීමක් සිදුකිරීමට බැංකුව ප්‍රතික්ෂේප කළ හැකිය. මුදල් ගෙවීමට සම්බන්ධ යම් පුද්ගලයෙකු නිසා හෝ නීතිය හෝ රෙගුලාසි වලට අනුකූලතාවය පිළිබඳව තොරතුරු හෝ පැහැදිළිකිරීමක් බලාධිකාරියක් විසින් ඉල්ලා සිටියි නම් හෝ එය ක්‍රියාවේ යෙදවීම ප්‍රතික්ෂේප කරයි නම් ගෙවීමක් ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය. බැංකුව විසින් අවශ්‍ය පරිදි ඔබගේ මුදල් යැවීම පිළිබඳ තොරතුරු හුවමාරු කරගනු ඇත.

10. වැඩකරන දින - බැංකුව විසින් කලින් කලට සිය ලැබුම් ශාඛාවන් හෝ මධ්‍යස්ථාන මගින් දැනුම් දී ඇති නියමිත කාල සීමාවන්ට (cut-off) පෙර බැංකුව වෙත ලැබෙන අයදුම්පත් ක්‍රියාවේ යෙදවීමට සාධාරණ උත්සාහයක් දරණු ඇත. එකී නියමිත කාලසීමාවන්ට පසුව ලැබෙන අයදුම්පත් ඊලඟ වැඩකරන දිනයේදී ක්‍රියාවේ යෙදවෙනු ඇත. මෙම අරමුණ සඳහා සියලු බැංකු නිවාඩු දින හා සති අන්ත වැඩ නොකරන දින අදාල නොවේ. ගෙවීමේ දිනය බැංකු නිවාඩු දිනයක් වන විට බැංකුව විසින් ඊලඟ වැඩකරන දිනයේදී ගෙවීම සිදුකරනු ඇත.

11. ගිවිසුම සහ අවසර ලබාදීම - මුදල් යැවීමේ අයදුම්පත අත්සන් කිරීම මගින් ඔබ පහත දෑ පිළිගෙන එකඟ වී සිටියි. (අ) ඔබ නීතිරීති සහ කොන්දේසි කියවා තේරුම්ගෙන සිටින බව සහ ඒවා මගින් බැඳී සිටීමට එකඟ වන බව (ආ) මෙම අයදුම්පත සම්බන්ධයෙන් ඔබ විසින් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත සපයා ඇති සියළු තොරතුරු සත්‍ය සහ නිවැරදි බව. (ඇ) මෙම කොන්දේසි වල දක්වා ඇති සමස්ත ගෙවීම, කොමිස් මුදල් (ඇත්නම්), වෙනත් ගාස්තු, පිරිවැය හා බදු මෙම ලේඛණයේ 'ගෙවීම් ආකෘතිපත්‍රය' හෝ 'ගාස්තු ආකෘතිපත්‍රය' යන අංශවල දක්වා ඇති ඔබේ ගිණුමෙන් හර කිරීමට ඔබ විසින් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට අවසර දෙන බව (ඈ) සමහර තතත්වයන් යටතේ, මුදල් යැවීමේ ඉල්ලීම බැංකුව විසින් ක්‍රියාවේ යෙදවීමට පෙර, වැඩිදුර අතිරේක ලිඛිත ප්‍රශ්න වලට පිළිතුරු දීමට ඔබට නියම කළ හැකි බව.